“ සියළු හිමිකම් ඇවිරිණි ”

අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගය - 2020
පිළිතුරු පත්‍ර

සිංහල භාෂාව හා සාහිත්‍යය III © All Right Received www.learntv.lk කාලය: පැය 02

01) i. අ) වර්තමාන කතාව.
අතීත කතාව.
සමෝධානය.

ආ) හතරවන පරාක්‍රමබාහු රජ දවස.

ii. අ) වායු ගණයෙනි.

ආ) සිරි පැරකුම් රජුගේ අගමැති සලාවත ජයපාල මැතිඳුන්.

iii. අ) නැන්වොහාමි / ආරච්චිලාගේ බිරිඳ.

ආ) මුළු ගම ම විනාශ වී කැලයෙන් වැසෙන බව ය.

iv. අ) එය රැක ගන්නට මෙ ලොවේ
සමත් වෙතොත් පුත නුඹ වේ.

ආ) රූපකාලංකාර භාවිතය.

v. අ) එච්.එම්. කුඩලිගම මහතා.

ආ) සිංහල ෂෙලී

vi. අ) ශෛලිගත සම්ප්‍රදාය

ආ) මහාවංශයේ සඳහන් සිංහල ජාතිය බිහි වීම පිළිබඳ කතා පුවත.

vii. අ) අමාවතුර

ආ) පුරිස දම්ම සාරථී බුදු ගුණය.

මෙම පිළිතුරු පත්‍රය www.learntv.lk වෙබ්අඩවිය මගින් 2020 අ.පො.ස සාමාන්‍ය පෙළ සිසුදරුවන් සඳහා නොමිලේ බෙදා දීම සිදු කරන අතර වෙබ් අඩවි සංස්කාරකගේ නිසි අවසරයකින් තොරව සම්පූර්ණ පිළිතුරු පත්‍රයම හෝ ඉන් කොටසක් වෙනත් වෙබ්අඩවියක එල කිරීම, විකිණීම, මුදලට ලබාදීම වාණිජ පරමාර්ථයෙන් බෙදා හැරීම බුද්ධිමය දේපළ පනත යටතේ දඬුවම් ලැබිය හැකි වරදකි.
මේ පිළිබඳව විමසීම සඳහා h.d.hasarali@dharmavahini.tv/ info@learntv.lk යන විද්‍යුත් ලිපිනය මගින් හෝ 076-6566588 දුරකථන අංකය මගින් විමසීම් සිදු කළ හැක.

viii. ආ) උග්ගසේන නම් සිටුපුත්හුගේ වස්තුව.

ආ) විද්දත් දියණිය.

ix. අ) සුරවිමනක්

ආ) කෑරගල පද්මාවතී පිරිවෙන් විහාරය.

x. අ) බුත්සරණ - විද්‍යා චක්‍රවර්තීන්

ආ) කුස ජාතක කාව්‍ය - අලගියවන්න මුකවෙටි පඬිතුමා.

**02)**i. අ) චූලනී බ්‍රහ්මදත්ත රජු මියුලු නුවර වට කොට ගත් අවස්ථාව දැක බියට පත්වන වේදේහ රජු අස්වසන්නට පැමිණි මහෞෂධ පඬිතුමාට වේදේහ රජු විසින් බ්‍රහ්මදත්ත රජුගේ සේනාවේ තරම කියා පාන අවස්ථාව යි.

ආ) අක්ෂෞහිණියක් යනු, අංග සම්පූර්ණ මහා යුධ සේනාවකි. එනම්,

ඇතුන් 21870

අශ්වයන් 65510

රථ 21870

පාබළ 109350 වේ.

මෙවන් සේනාවන් 18ක් අටළොස් අක්ෂෞහණිති යන්නෙන් අදහස් වේ.

ii. අ) යම් කාර්යයක් සඳහා යමෙකුගේ හැකියාව / දක්ෂතාව එම කාර්යය සිදු කිරීම ආරම්භ කරන පළමු අස්ථාවෙන් ම තීරණය වේ.මිනිසාගේ ක්‍රියාවෙන් ඔහුගේ චේතනාව හඳුනා ගත හැකිවීම.

ආ) අමුතු බත් දීම - අමුත්තන්ට බත් සඳහා ඇරයුම් කිරීම.

අඬහැරය - සීසාන විට ගවයන් දිරිමත් කිරීමට නගන ශබ්දය

iii. අ) බාධක , අභියෝග නොමැති ජීවිතය නීරස බව/කම්මැලි ස්වභාවයක් ගෙන එන බව.

ආ) අනුප්‍රාසය.

සංකේත පද භාවිතය.

මෙම පිළිතුරු පත්‍රය www.learntv.lk වෙබ්අඩවිය මගින් 2020 අ.පො.ස සාමාන්‍ය පෙළ සිසුදරුවන් සඳහා නොමිලේ බෙදා දීම සිදු කරන අතර වෙබ් අඩවි සංස්කාරකගේ නිසි අවසරයකින් තොරව සම්පූර්ණ පිළිතුරු පත්‍රයම හෝ ඉන් කොටසක් වෙනත් වෙබ්අඩවියක එල කිරීම, විකිණීම, මුදලට ලබාදීම වාණිජ පරමාර්ථයෙන් බෙදා හැරීම බුද්ධිමය දේපළ පනත යටතේ දඬුවම් ලැබිය හැකි වරදකි.
මේ පිළිබඳව විමසීම සඳහා h.d.hasarali@dharmavahini.tv/ info@learntv.lk යන විද්‍යුත් ලිපිනය මගින් හෝ 076-6566588 දුරකථන අංකය මගින් විමසීම් සිදු කළ හැක.

iv.අ) උත්සවයට යාමට මැටිල්ඩාගේ ඇඳුම් සූදානම් වුවත් ඇයට ඒ සඳහා දැමීමට ආභරණ නොමැති නිසා දුකට පත්ව සිටින විට සැමියා ඒ පිළිබඳ විමසන අවස්ථාවේදී මැටිල්ඩා ලබා දුන් පිළිතුරකි.

ආ) "මල් ටිකක් ගහ ගන්නකො" යැයි ඇයට යෝජනා කිරීම.

v. අ) ★හුලංදා ඔයෙහි ඉවුරු දෙකින් ශබ්ද නගා ජලය ගලා යාම.

★ හාත්පස සුවඳවත් පරිසරයක් පැවතීම.

★ කෙකටියා පදුරේ සුදු මල් පොකුරක් පිපී තිබීම.

ආ) දෑල - දෙ+ඇල

ඇලෙහි ඉවුරු දෙක

නිල් වතුර - සීතල පිරිසිදු ජලය

**03)** I සිංහබාහු නූතන පරම්පරාවේ සිතුම් පැතුම් නියෝජනය කරන අයුරු.

1) නිදහස සොයා යාමට අපේක්ෂා කිරීම.

★ ඔබ දෙදෙන මා සමග
නො ආවොත් යන්ට වේ
ඔබ දමා මේ ලෙනේ
මට උරුම වූ දිවිය
මා සොයා යා යුතුයි.

2) උරුමය ලබා ගැනීමටත් / යුතුකම් ඉටු කිරීමටත් ඇති ආශාව

★ යන්ට දැන් නම් කාලෙ වේ
මෑණියන් හා නැගණි සමගින්
උරුමෙ අපගේ සොයමිනා
වංග දේසේ වෙසෙන ජනතාව
කෙරෙහි වේ මා යුතුකමා...

ii. සිංහයා සාම්ප්‍රදායික පරම්පරාවේ සිතුම් පැතුම් නියෝජනය කරන අයුරු

(1) දරුවන්ට අවැසි ආරක්ෂාව හා පෝෂණය දෙමාපියන් විසින් ලබා දිය යුතු බව විශ්වාස කිරීම.

උදා - සිත නොම සැනසේ හිඳිනට මෙලෙසේ දිවි හිමියන් මෙ ලෙනේ බොහො ආදර ඇති මුත් මා පිය අප හට පල නැත මේ දිවියෙන් අප හට.

මෙම පිළිතුරු පත්‍රය www.learntv.lk වෙබ්අඩවිය මගින් 2020 අ.පො.ස සාමාන්‍ය පෙළ සිසුදරුවන් සඳහා නොමිලේ බෙදා දීම සිදු කරන අතර වෙබ් අඩවි සංස්කාරකගේ නිසි අවසරයකින් තොරව සම්පූර්ණ පිළිතුරු පත්‍රයම හෝ ඉන් කොටසක් වෙනත් වෙබ්අඩවියක එල කිරීම, විකිණීම, මුදලට ලබාදීම වාණිජ පරමාර්ථයෙන් බෙදා හැරීම බුද්ධිමය දේපළ පනත යටතේ දඩුවම් ලැබිය හැකි වරදකි.
මේ පිළිබඳව විමසීම සඳහා h.d.hasarali@dharmavahini.tv/ info@learntv.lk යන විද්‍යුත් ලිපිනය මගින් හෝ 076-6566588 දුරකථන අංකය මගින් විමසීම් සිදු කළ හැක.

LearnTV

(2) වැඩිවියට එළඹුන ද දරුවන් ට දැනුමක් නැතැයි සිතීම

නොදනිති හසරක් නුපුරුදු ඒ තිදෙන
පැමිණෙන පිරිපත වළකනු කෙලෙස ද
දිරි ඇති මුත් පුත නරයෙකි ගත මුදු
ලොව දැක නැත අද වන තුරු කිසි කල

**නැතහොත්**

i. ජාතිකාභිමානය ඉස්මතු කරවන අයුරු

දෑසේ කඳුළැලි පිසදා බලනෙමි
හෙට හිරු එළියට වඩින දිනේ
ණය නැති බිය නැති නිවහල් යුගයක
පුංචි පුතා රජ කරනු පෙනේ.

දෙදහස් පන්සිය වසරක් තිස්සේ
මා දුටු සිහිනය පුංචි පුතුන්
ඔබ හට ලෝකය ඉදි කර දී මිස
යා නොහැකි ය මට පුංචි පුතුන්

ii. ශ්‍රමාභිමානය ඉස්මතු කරවන අයුරු

★ දෑතේ කර ගැට සිඹ සනසන්නට
ළා ගොයමේ දළු පවන් සලයි
දහදිය මුතු ඇට මල් වරුසා වී
කරල් බරින් පිදී වැගිරෙයි

★ මා ගත වෙහෙසට ආදරයෙන් දිය
උල්පත පාදන පුංචි පුතුන්
ඒ ගත වෙහෙස ම සතුටක් වෙයි මට
ඔබ සිහිවන විට පුංචි පුතුන්

Learn TV

**04)** i. දියමන්ති මාලය නැති වීමට පෙර මැටිල්ඩා

★ සිහින ලෝකයක ජීවත්වන කෙනෙකු වීම.

උදා - ★ ඇය සිතින් ජීවත් වූයේ තමාට තරම් නොවන පහත් විවාහයකට මැදිහත් වූ එකියක මෙන් අසන්තෝෂයෙනි.

මෙම පිළිතුරු පත්‍රය www.learntv.lk වෙබ්අඩවිය මගින් 2020 අ.පො.ස සාමාන්‍ය පෙළ සිසුදරුවන් සඳහා නොමිලේ බෙදා දීම සිදු කරන අතර වෙබ් අඩවි සංස්කාරකගේ නිසි අවසරයකින් තොරව සම්පූර්ණ පිළිතුරු පත්‍රයම හෝ ඉන් කොටසක් වෙනත් වෙබ්අඩවියක එල කිරීම, විකිණීම, මුදලට ලබාදීම වාණිජ පරමාර්ථයෙන් බෙදා හැරීම බුද්ධිමය දේපළ පනත යටතේ දඩුවම් ලැබිය හැකි වරදකි.
මේ පිළිබඳව විමසීම සඳහා h.d.hasarali@dharmavahini.tv/ info@learntv.lk යන විද්‍යුත් ලිපිනය මගින් හෝ 076-6566588 දුරකථන අංකය මගින් විමසීම් සිදු කළ හැක.

★ පෙර දිග මහාර්ඝ තිර රෙදිවලින් අලංකාර කරන ලද, උස් ලෝකඩ පහන් රුක්වලින් ඒකාලෝක කරන ලද........... මිතුරන් ස්වල්ප දෙනකුන්ගේ ප්‍රිය සමාගමය සඳහා ම වෙන් කරන ලද සුගන්ධවත් සුන්දර ආහාර ද සිතින් මවා ගත් ඈ ඒවා පිළිබඳ කල්පනාවෙන් මනෝ ලෝකයක ජීවත් වූවා ය.

ii. දියමන්ති මාලය නැති වූ පසු මැටිල්ඩා

★ අභියෝගවලට දිරියෙන් මුහුණ දිය හැකි අව්‍යාජ වීර ගැහැනියක් වීම, කීකරු බිරිඳක් වෙමින් සැබෑ ගැහැනියක් ලෙස සැබෑ ලෝකයේ ජිවත් වන්නියක් වීම.

උදා - ★ ගෙදර දොරක පවත්නා බර වැඩ කටයුතු ගැන ද, මුළුතැන්ගෙයක පීඩාකාරී වෙහෙස කර වැඩ පළ ගැන ද ඇය තුළ අවබෝධයක් ඇති වූයේ ය.

★ මේ වන විට ලොයිසල් මහත්මිය මහලු පෙනුමකින් යුතු ව සිටියා ය. ඈ දිළිඳු ගෙවල වසන අනෙක් ස්ත්‍රීන් මෙන් හැඩි දැඩි ශක්තිමත් ගොරෝසු දරදඬු ස්ත්‍රියක බවට පත් ව සිටියා ය.

**නැතහොත්**

i. "මග විසිතුරු" පාඩම - අර්ථ රසය මතු කරවන අයුරු

★ උපමා භාවිතය

වනසිරි පියුම්රා බඳ රන්'බරණ යුරු
වට පිරි සුපුල් දුනුකේ මල් මුරුත තුරු
බිඟුපිරි වැරෑ ඔලු'පුලැ'මුලවල තඹුරු
හිමසරි සිහිල් දිය හෙබ දැකයන් මිතුරු

★ ස්වභාවෝක්ති වර්ණනා/ ව්‍යංග්‍යාර්ථවත් බස

සන්නන් සිහින් ගෙඳි සෙවණලු වැලි තෙලෙන
තැන් තැන් වල ම සැතැපී සියුමැලි බැවින
රන්වන් කරල ගෙනැ එන ගිරවුන් අතින
යන්මන් තොසින් මඟ තොරතුරු නියම දැන

මෙම පිළිතුරු පත්‍රය www.learntv.lk වෙබ්අඩවිය මගින් 2020 අ.පො.ස සාමාන්‍ය පෙළ සිසුදරුවන් සඳහා නොමිලේ බෙදා දීම සිදු කරන අතර වෙබ් අඩවි සංස්කාරකගේ නිසි අවසරයකින් තොරව සම්පූර්ණ පිළිතුරු පත්‍රයම හෝ ඉන් කොටසක් වෙනත් වෙබ්අඩවියක පළ කිරීම, විකිණීම, මුදලට ලබාදීම වාණිජ පරමාර්ථයෙන් බෙදා හැරීම බුද්ධිමය දේපළ පනත යටතේ දඬුවම් ලැබිය හැකි වරදකි.
මේ පිළිබඳව විමසීම සඳහා h.d.hasarali@dharmavahini.tv/ info@learntv.lk යන විද්‍යුත් ලිපිනය මගින් හෝ 076-6566588 දුරකථන අංකය මගින් විමසීම් සිදු කළ හැක.

Learn TV

ii. ශබ්ද රසය මතු කරවන අයුරු
★අනුප්‍රාසය

වල ඳින අදහසින් මෙන් සුර ගඟ අඟන
නල බල සසල දළ රළ පෙළ නුබ නැගෙන
වෙල ළඟ ගැවැසි මුතු සක් පබළු බබළන
බල මහ මුහුද එම සැඳැ උතුරින් පෙනෙන

★එළිසමය / එළිවැට

රිවි තැවුලේ පිපි කමලේ විල් ගැවසී.
මත තොවුලේ තුරු වදලේ හඬන නිසි
වන සැවුලේ මඟ අසලේ පොර සැලැසී
ගුරු බැවුලේ යව අවුලේ නොවී කිසි

**05)** වෑත්තෑවේ හිමිගේ ප්‍රතිභාපූර්ණ කවිත්වය මතු කරවන කාව්‍යාලංකාර.

1. විරිත්වල විවිධත්වය

ගුත්තිල ඇඳුරු සඳ
වීණා වයන ලෙස ඉඳ
පසෙක පනවන ලද

සුදුසු අස්නෙක ගොසින් උන් සඳ - ගී විරිත.
මනමත් කරවන දන මුළු දෙරණා - පෙද විරිත.
රූ රැසේ අඳින ලෙසේ අත් ලෙළ දිදී විදුලිය පබා - විසි අටමත් විරිත.

2) උපමා භාවිතය

පිය සන් නො ව බිගු දැල් රැදි කොපුලී
අවසන් නො ව වෙණ නදට ම කුහු ලී
මද සන් සුන් පියොවින් සිටි නොසැලී
ගජ සෙන් සිතියම් ගජ සිරි කියෙලී.

3) අනුප්‍රාසාත්මක බස්වහර

දිය දිය ගොස පළ කෙරෙමින් සපැමිණි
ගිය ගිය තැන ඉස්වා රන් මුතු මිණි
ගිය ගිය දිය නද එන මෙන් ගෙන මිණි
සිය සිය ගුණයෙන් වෙණ හද නික්මිණි

මෙම පිළිතුරු පත්‍රය www.learntv.lk වෙබ්අඩවිය මගින් 2020 අ.පො.ස සාමාන්‍ය පෙළ සිසුදරුවන් සඳහා නොමිලේ බෙදා දීම සිදු කරන අතර වෙබ් අඩවි සංස්කාරකගේ නිසි අවසරයකින් තොරව සම්පූර්ණ පිළිතුරු පත්‍රයම හෝ ඉන් කොටසක් වෙනත් වෙබ්අඩවියක එල කිරීම, විකිණීම, මුදලට ලබාදීම වාණිජ පරමාර්ථයෙන් බෙදා හැරීම බුද්ධිමය දේපළ පනත යටතේ දඩුවම් ලැබිය හැකි වරදකි.
මේ පිළිබඳව විමසීම සඳහා h.d.hasarali@dharmavahini.tv/ info@learntv.lk යන විද්‍යුත් ලිපිනය මගින් හෝ 076-6566588 දුරකථන අංකය මගින් විමසීම් සිදු කළ හැක.

LearnTV

**06)** අමාවතුර කෘතියෙහි භාෂා ශෛලියෙහි විශේෂ ලක්ෂණ

1. කෙටි වැකි - දිගු වැකි භාවිතය.

උදා - සොර ක්ලාන්ත වියැ මියෙහි කෙළ සිඳී ගියෙ
ශරීරයෙන් ස්වේද බස්සී.

පෙරවරු සුගත් මහපහුල් හැඳැ පෙරෙවැ නුවර වැදැ වළඳා වෙහෙර ගොස් ඔව්හට සඞ්ග්‍රහ කටැටි වැ දෙව්රමින් නික් මැ අඩන් මඟ පිළිපන්හු.

2) පාලි සංස්කෘතික වචන සීමිතව යොදා ගනිමින් ඉපැරණි බස්වහර භාවිතා කිරිම.

ආශ්චර්ය යැ - පුදුමයකි.
දුබ්භෝජනයෙනුදු - නරක ආහාර ගැනීමෙන් ද
දුක්ඛසෙය්‍යායෙහනුදු - දුක සේ හිඳා ගැනීමෙන් ද
බහ බහා සිටිවැයි - පස්සට පස්සට තල්ලු කරයි.

3) සංවාදාත්මක බස් වහර

★ කොසොල් රජු හා භර්ග බමුණු අතර සංවාදය.
★ සෙසු ශිෂ්‍යයන් හා ගුරුතුමා අතර සංවාදය.
★ භර්ග බමුණා සහ බිරිඳ අතර සංවාදය.
★ බුදුන් වහන්සේ සහ කොසොල් රජු අතර සංවාදය.
★ බුදුන් වහන්සේ සහ අංගුලිමාල අතර සංවාදය.

Learn TV

මෙම පිළිතුරු පත්‍රය www.learntv.lk වෙබ්අඩවිය මගින් 2020 අ.පො.ස සාමාන්‍ය පෙළ සිසුදරුවන් සඳහා නොමිලේ බෙදා දීම සිදු කරන අතර වෙබ් අඩවි සංස්කාරකගේ නිසි අවසරයකින් තොරව සම්පූර්ණ පිළිතුරු පත්‍රයම හෝ ඉන් කොටසක් වෙනත් වෙබ්අඩවියක එල කිරීම, විකිණීම, මුදලට ලබාදීම වාණිජ පරමාර්ථයෙන් බෙදා හැරීම බුද්ධිමය දේපළ පනත යටතේ දඩුවම් ලැබිය හැකි වරදකි.
මේ පිළිබඳව විමසීම සඳහා h.d.hasarali@dharmavahini.tv/ info@learntv.lk යන විද්‍යුත් ලිපිනය මගින් හෝ 076-6566588 දුරකථන අංකය මගින් විමසීම් සිදු කළ හැක.

**07)** කුරක්කන් වගාවේ දී ගොවියා මුහුණ දුන් අභියෝග ජය ගැනීමට ඔහු දැරූ වෙහෙස

මා කී දේ දෙයියනි බොරුවක් ම නැති
බිම එළි වුණොත් කණු මදු බොහොම ළඟ ඇති
ඇහැට වෙහෙස ඇත තුන් යමට නිදි නැති
ගොබ කළු වෙමින් කුරහන් කිරි වැද වැඩෙති

කටු ඇල්ලේ මගෙ හේනේ කුරක්කන්
වැට අහුරා ඌරන්ගෙන් වළක්කන්
කර ගන්නට බැරි උන් මහ කුරක්කන්
ඌරෙනි නොකා පලයව් මගෙ කුරක්කන්

කුරක්කන් තුනයි වැපුරුවෙ අමාරුවේ
කපන්ටත් බැරුව අතපය රුදාවේ
අරින්ටත් බැරුව ලොවග ම සිනාවේ
කපමු නෑනෙ ඉපනැල්ලේ සුබාවේ

Learn TV

මෙම පිළිතුරු පත්‍රය www.learntv.lk වෙබ්අඩවිය මගින් 2020 අ.පො.ස සාමාන්‍ය පෙළ සිසුදරුවන් සඳහා නොමිලේ බෙදා දීම සිදු කරන අතර වෙබ් අඩවි සංස්කාරකගේ නිසි අවසරයකින් තොරව සම්පූර්ණ පිළිතුරු පත්‍රයම හෝ ඉන් කොටසක් වෙනත් වෙබ්අඩවියක එල කිරීම, විකිණීම, මුදලට ලබාදීම වාණිජ පරමාර්ථයෙන් බෙදා හැරීම බුද්ධිමය දේපළ පනත යටතේ දඬුවම් ලැබිය හැකි වරදකි.
මේ පිළිබඳව විමසීම සඳහා h.d.hasarali@dharmavahini.tv/ info@learntv.lk යන විද්‍යුත් ලිපිනය මගින් හෝ 076-6566588 දුරකථන අංකය මගින් විමසීම් සිදු කළ හැක.